# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/3 – 2014 ජූලි මස 28 වැනි සඳුදා - 2014.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ 255 වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි.

2. උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය, ඉඩම්, මාර්ග සංවර්ධන, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, ජල සම්පාදන, සමූපකාර සංවර්ධන, සමාජ සුහසාධන, පුනරුත්ථාපන, වනිතා කටයුතු, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආහාර නිෂ්පාදන හා බෙදාහැරීම්, විෂයයන් භාර අමාත්‍යවරයා වන විනිසුරු සී. වී. විග්නේශ්වරන් වන මම, 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල මත මහ නගර සභා ආඥාපනතේ 184 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුව පහත දක්වනු ලබන කරුණු/චෝදනා සම්බන්ධව වල්වෙට්ටිතුරෙයි නගර සභාවේ කාර්යයන් පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 වන වගන්තියේ (1), (1ආ)(අ) යන උපවගන්ති වලට අනුව ඒක පුද්ගල පරීක්ෂණ කමිටුවකට විශ්‍රාමලත් දිස්ත්‍රික් අධිකරණ නීතිපති වන කන්දයියා අරියනායගම් මහතා පත් කර ඇත.

3. පරීක්ෂණ පැවැත්විය යුතු කරුණු/චෝදනා :-

(i) සභා රැස්වීම් සම්මතයක් මගින් සභාව ක්‍රියා විරහිත තත්ත්වයට පත් කිරීම.
(ii) රැස්වීම් කැඳවීමට හෝ එයට සහභාගීවීමට හෝ කැඳවන රැස්වීමට ඡන්දය දීමට හෝ කිසිදු රැස්වීමක කාර්යයක් ඉටු කිරීමට තිර ලෙස විඛණ්ඩනය කිරීම.
(iii) නගර සභා ආඥාපනතේ පනවන ලද කාර්යයන් ඕනෑකමින්ම නොසලකා හැර තිබීම හෝ එකී කාර්යයන් ඉටු කිරීමෙහි දී නොමනා ලෙස හැසිරීම.
(iv) අදක්ෂව හා අක්‍රමවත්ව කළමනාකරණය කිරීම.
(v) නගර සභා ආඥාපනතින් පිරිනමා ඇති බලතල අනිසි ආකාරයෙන් පාවිච්චි කිරීම.

4. උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය, ඉඩම්, මාර්ග සංවර්ධන, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, ජල සම්පාදන, සමූපකාර සංවර්ධන, සමාජ සුහසාධන, පුනරුත්ථාපන, වනිතා කටයුතු, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආහාර නිෂ්පාදන හා බෙදාහැරීම්, විෂයයන් භාර අමාත්‍යවරයා වන විනිසුරු සී. වී. විග්නේශ්වරන් වන මම, 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය

1A - PG 2124—10 (2014/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සමඟ කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නගර සභා ආඥාපනතේ 184 වන වගන්තියේ (1), (1ආ)(අ) සහ (iii) යන උපවගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, යාපනය දිස්ත්‍රික්කයේ වල්වෙට්ටිතුරෙයි නගර සභාවේ කටයුතු වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ. සභාවෙහි අත්හිටුවා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යයන් ඉටු කිරීමට යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වන කොන්ස්ටන්ටයින් ජැක්සීල් මහතාට විධාන කරනු ලැබේ.

විනිසුරු සී. වී. විග්නේශ්වරන්,
උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය,
ඉඩම්, මාර්ග සංවර්ධන, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, ජල සම්පාදන,
සමූපකාර සංවර්ධන, සමාජ සුභසාධන, පුනරුත්ථාපන, වනිතා කටයුතු,
කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආහාර නිෂ්පාදන හා බෙදාහැරීම් පිළිබඳ විෂයයන් භාර අමාත්‍යවරයා.

2014 ජූලි මස 25 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
අංක 26, සෝමසුන්දරම් ඇවිනිව්,
චුන්ඩුක්කුලි,
යාපනය.

08-464

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.